# ඉරිඟු හොරා



ශෙනාෂි අදීශා දහනායක

කෘතියේ නම : ඉරිඟු හොරා

ISBN අංකය : **978-624-211-035-6 IS49095**

කතෘගේ නම : ශෙනාෂි අදීශා දහනායක

කෘතිය පළ කරන දිනය : 2026.05.10

මුද්‍රණය : **' The PRESS'**
කොටුගොඩැල්ල වීදිය,
මහනුවර

# පිදුම

**මාගේ ආදරණීය මහාමායා මෑණියන්ට**

**මගේ මේ පොත**

**ආදරයෙන් පුදමි.**

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදනමෙ කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ  දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමයා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයෙන් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ වයාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ අශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ඨ සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත්.බී.එස්.අභයකෝන්.
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත,
සම්මානනිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දු දරුවන් ග්‍රන්ථකරණය යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය,ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කාර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධන වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණය වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණය ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# ස්තූතිය

මට මේ පොත ලස්සනට ලියන්න කියල දීල උදව් කළ මගේ ඉස්කෝලේ සියලුම ගුරු මෑණිවරුන්ටත්, මගේ අම්ම, තාත්තා ඇතුළු පවුලේ සියලු දෙනාටත් මම ගොඩක් ස්තූති වන්ත වෙනවා.

ශෙනාෂි අදීශා දහනායක වන මාගේ මෙම නිර්මාණය ඔබ සියලු දෙනාට රසවින්දනය කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.

කතෘගේ නම : ශෙනාෂි අදීශා දහනායක

ලිපිනය : 15/24, ජලාශය පාර, මහනුවර.


දුරකතන අංකය : 075 - 855 9498



එකමත් එක ගමක විශාල කන්දක් පා

මුල ලස්සන ගෙයක් තිබුණා.

එහි කඩිසර බලු රාළ කෙනකු සිටියා.



මේ බලු රාළ හරි ම ආසයි වගා කරන්න.

එයාට තිබුණා ලොකු බඩඉරිඟු වගාවක්.



බලු රාළ හැමදාම උදේට වගාවට ඇවිත් බලද්දි බඩ ඉරිඟු පැළ කවුදෝ කඩලා දාලා

"ඉරිඟු කරල් ඔක්කොම කාලා " බලු රාළ දුකින් කිව්වා.



දින කිහිපයක්ම මේ සිදුවීම සිදු වුණා. බලු රාළට මේක ලොකු ප්‍රශ්නයක් වුණා. බලු රාළ කල්පනා කරා කොහොම ද මේ ඉරිඟු හොරාව අල්ලගන්නේ කියලා.

ගෙදර තිබුණු දැල මතක් වුණා. බලු රාළ හිතුවා ඒ දැල එළලා හොරාව අල්ලන්න කියලා. ගෙදර ගිහින් දැල අරන් ඇවිත් වගාවට එලුවා. දැල එලලා බලු රාළ සතුටින් ගෙදර ගියා.

''හෙට උදේට ඇවිත් බලමුකෝ ඉරිඟු හොරා කවුද කියලා '' බලු රාළ හිතුවා.


එදා රෑ බලු රාළට නින්ද ගියේත් නෑ එළි වෙනකන් ඉවසිල්ලක් නැතිව බලාගෙන හිටියා.

යාන්තම් එළිය වැටීගෙන ආවා. බලු රාළ පාන්දර ම නැඟිටලා වෙනදටත් කලින් වගාව ළඟට යන්න පිටත් වුණා. ඉක්මනින් ඉක්මනින් ගියා.



ඉරිඟු වගාව ළඟට යද්දි බලු රාළ දැක්කා දැලට පැටලිලා ඉන්න වඳුරු පැංචාව.

බලු රාළට හිනා ගියා.



මේ ඉන්නේ "ඉරිඟු හොරා "

අනේ, අනේ වඳුරු පැංචෝ ඔයාද

එතකොට බඩ ඉරිඟු හොරා

ඇයි වඳුරු පැංචෝ මෙහෙම

හොරෙන් අනුන්ගේ වතු වලට පැනලා

හොරොන් කන්නේ.


අනේ මට සමාවෙන්න

මම ආයේ මෙහෙම හොරෙන් කන්නේ නැහැ.

ඔයාගේ බඩඉරිඟු හොඳට හැදිලා තිබුණු නිසා මට කන්න ආසා හිතුනා ඒකයි මම හැමදාම රෑට ඇවිත් කෑවේ.



ඔයා හුඟක් වැරදි වැඩක් කරේ වඳුරු පැංචෝ ආය එහෙම වැරදි වැඩ කරන්න එපා. ඔයත් මං වගේ ලොකු වගාවක් හදා ගන්න.



ඔයාට ඕනවෙලාවක ඇවිත් මගෙන් අහලා කන්න.

අනුන්ගේ දේවල් හොරෙන් ගන්න හොඳ නැහැ.කවදාවත් ම අනුන්ගේ දේවල් කවදාවත් හොරෙන් ගන්න හොඳ නැහැ අපි මහන්සි වෙලා දෙයක් ලබාගත්තම ගොඩක් සතුටු වෙන්න පුළුවන්.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කරුවන් දැයට දායාද කල මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනිමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් ''හේමමාලා උපහාර '' ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්විමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලුම දෙනාටද, දියවඩන නිළමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)